
24 03 2025

හිතවතුනි

අපගේ පුළුල් විද්‍යාත්මක විසඳුම් ආරම්භ කරන ලද්දේ 03 11 2025 දිනය. දින දාහතරක් සම්පූර්ණ වන්නේ හෙට (03 24 2025) දිනටය.

මෙතෙක් සම්බන්ධ වී ඇති අපගේ වටිනා සහෘදයන් ඔවුන්ට අදාළ පැමිණිලි සමග දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේදී ඍජුව අදාළ වන විෂය පථය ලෙස හඳුන්වා ඇති දත්ත විශ්ලේෂණයෙන් ගම්‍ය වන ප්‍රධාන කරුණු වන්නේ.

ආරක්ෂක **39.7%** ක්ද
අධිකරණ, ජාතික ඒකාබද්ධතා සහ මහජන ආරක්ෂක **13.8%** ක්ද
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික **10.3%** ක්ද
ඇතුළු අනික් විෂය පථයන් **36.2%** ක්ද වශයෙනි.



මෙමගින් ගම්‍ය වන්නේ කුමක් ද?

සෟජුව විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මෙන්ම රටේ විධායක ජනාධිපතිවරයා වන අනුර කුමාර දිසානායක මහතාගේ මෙහෙවර සහ දැක්මට අනුව යම් සාධනීය කරුණු කාරණා වාර්තා වුවත් රාජ්‍ය පරිපාලනය පිළිබඳව තිබෙන අකාර්යක්ෂමතාවයයි.

ඒ සඳහා නිසි ක්‍රමවේද සම්පාදනය නොකිරීම හේතු කොට ගෙන මහජන බදු මුදලින් නඩත්තුවන ජනාධිපති ලේකම් තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයද වගකිව යුතුයි.

තවදුරටත් ජනාධිපති උපදේශකවරුන් මෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ න්‍යායාචාර්යවරුන් වශයෙන් පෙනී සිටින

ටිල්වින් සිල්වා ඇතුළු ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන් ඉතා වෙහෙසකර ප්‍රයත්නයකින් මාලිමා සන්නාමය යටතේ හැටඅට ලක්ෂයකගේ ශ්‍රම දායකත්වයෙන් රාජ්‍ය බලය අත්පත් කර ගැනීමට සමත් වුවත් රටක රාජ්‍ය පාලනය පිළිබඳව නිපුණත්වය තවමත් අත්පත් කරගෙන **(නොමැති)** බව නිරීක්ෂණය වේ.

මෙතෙක් නිහඬව සිට පිරිස් මාලිමාවට දෝෂාරෝපණය කරන්නේ මන්ද? යන්න ඔබට මනාව වැටහෙනු ඇත. විද්වත් මණ්ඩපයේ මීළඟ වාර්තාවෙන් ඒ පිළිබඳව මනාව විග්‍රහ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නමුත් **SaliyaT** සන්නාමය යටතේ ක්‍රියාත්මක වන විද්වත් මණ්ඩපය උත්සාහ කරනුයේ ජනාධිපතිවරයාට අවශ්‍ය වෘත්තිමය සහාය ලබා දීමක් මිසක් මාලිමාවට පහර දීම හෝ කිසිසේත්ම අකුල් හෙළීමක් නොවේ.

සාධනීය කරුණු රැසක් වාර්තා වන අවධියක ධනාත්මකව ගනු මැනවි.

SaliyaT
3/24/2025 21:49:59